# 12 කරුණාකර බදු ( *Zeikin* ) ගෙවන්න

ඔබට අදාල <u>බදු මුදල් ගෙවීමේ නියමිත දිනය ( *Nōfu Kigen* )</u> ට පෙර ගෙවා අවසන් කරන්න.
බදු මුදල් නියමිත දිනට වඩා ප්‍රමාද වී ගෙවීමේදී ගෙවියයුතු මුදල් ප්‍රමාණය වැඩිවන බව සලකන්න.
<u>බදු මුදල් ගෙවීමේ නියමිත දිනය ( *Nōfu Kigen* )</u> මුදල් ගෙවියයුතු ලියවිල්ලේ සඳහන් කරඇත.
<u>බදු මු දල් ගෙවීමේ නියමිත දිනය ( *Nōfu Kigen* )</u> වනවිටගෙවීම් කටයුතු කිරීමටඅපහසු වුවහොත් ＜ බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) ＞ වෙත ගොස් උපදෙස් ලබාගන්න.

## බදු ගෙවීම පිළිබඳව දැනුම් දීම සඳහා නිවසට යවනු ලබන ලියවිල්ල ( *Nōzei Tsūchisho* )

පහත රූපයේ සඳහන් ලියුම් කවරය තැපැලෙන්ඔබගේ නිවසට යවනු ලැබේ.
ලිපිය ලැබුණුවිට අනිවර්යයෙන්ම ලියුම් කවරයේ ඇතුළේ ඇති ලිපිය බලන්න. නියමිතකර ඇති දිනට පෙර කරුණාකර බදු මුදල් ගෙවා අවසන් කරන්න.




◎ 30 වෙනි පිටුවේ අමාරු වචන ◎

※නියමකළ දිනය : මෙඉන් අදහස් කරන්නේ බදු ගෙවන දිනය යන්නයි.මුදල් ගෙවන කොලයේ「ගෙවීම සඳහා අවසන් දිනය」යනුවෙන් සඳහන් කරඇත.අනිවාර්යයෙන්ම නියමකළ දිනයට කරුණාකර බදුමුදල් ගෙවන්න.

## නගර බදුගෙවීමේ නියමිත

පහත සදහන් බදු වර්ග පිළිබදව එම බදු මුදල් ගෙවියයුතු මාසය සදහන් කර ඇත. කුමන දිනට පෙර මුදල් ගෙවිය යුතුද යන්න ගෙවිම්පත (*Nōfusho*) පරීක්ෂාකර බලන්න.බදු මුදල් නියමකර ඇති දිනට පෙර ගෙවා අවසන් නොකළහොත් ඔබට වැඩිපුර මුදලක් සමග ගෙවීමට සිදුවේ.

| | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තොම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | ජනවාරි | පෙබරවාරි |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| (නාගරික ජීවනබදු) *Shikenminzei* | | ○ | | ○ | | ○ | | | ○ | |
| ( දේපළබදු ) *Koteishizanzei* | ○ | | ○ | | ○ | | | ○ | | |
| ( කේ වාහන සදහා ගෙවන බදු ) *Keijidōshazei* | ○ | | | | | | | | | |
| ( ජාතික සෞඛ්‍ය රක්‍ෂණ බදු ) *Kokumin Kenkōhokenzei* | | | ○ | ○ | ○ | ○ | ○ | ○ | ○ | ○ |

## බදුගෙවූබව සදහන්කරන සහතිකය ( *Nōzei Shōmeisho* )

බදුගෙවූබව සදහන්කරන සහතිකය ( *Nōzei Shōmeisho* ) යනු වෙන් හැදින්වෙන්නේ අදාල බදු මුදල් කොතරම් ප්‍රමාණයක් ගෙවා අවසන් කර ඇතිද,යැයි සදහන් කර ඇති ලියවිල්ලක් වේ.



## ✎ බදු වාර්ථා ගොණුකිරිම ( *Kakutei shinkoku* )

ඔබ රැකියාවේ වැටුප් ලබා එම මුදල් එකතුකර පුද්ගලයින් සහ සමාගමෙන් වැටුප් ලබන පුද්ගලයින් <u>ආධායම් බදු (*Shotokuzei* )සදහා අධායම් වාර්ථා</u> සකස් කොට නගරසභාවට ඉදිරිපත් කළයුතු වේ.

<u>ආධායම් බදු(*Shotokuzei* ) සදහා අධායම් වාර්ථා</u> සකස් කොට බදු කාර්යාලයට සහ නගරසභා කාර්යාලයට ඉදිරිපත් කළයුතුවේ.
<u>ආධායම් බදු සදහා(*Shotokuzei* ) අධායම් වාර්ථා</u> ඉදිරිපත් නොකළහොත් ආධායම්බදු සහතිකය ( *Shotoku・Kazei Shōmeisho*) ලබාගැනීමට නොහැකිවේ.

① බදු වර්ථා සකස් කිරීමේ කාලසීමාව ( *Kakuteishinkoku* )
සෑම වර්ෂයකම පෙබරවාරි මාසයේ 16 වෙනිදා සිට මාර්තු මාසයේ 15 වෙනිදා දක්වා කාලය

② බදු වර්ථා සකසන ස්ථානය
<u>බදු ගෙවීමේ කාර්යාලය</u> ට යන්න.
පෙබරවාරි මාසයේ 16 වෙනිදා සිට මාර්තු මාසයේ 15 වෙනිදා දක්වා කාලය තුළ නගරසභා කාර්යාලයේදී බදු වර්ථා සකස් කිරීම (*Kakuteishinkoku*) සිදුකරනු ලබනවා.

③ කවදා ලබාගත් (එක්කාසු කල) මුදල් ගණන් කරනු ලබනවාද?
ජනවාරි පළවෙනිදා සිටදෙසැම්බර් 31 වෙනිදා අතර කාලයතුළ ලබාගත් (එක්කාසු කරනුලැබූ) මුදල්ගණන් කර, ඊලග වසරේ පෙබරවාරි මාසයේ බදුවාර්ථා ලේඛණ (ඉදිරිපත් කරන්න).

④ රැකියා නොකරන පුද්ගලයින් සහ මුදල් නොලැබෙන පුද්ගලයින් කුමක් කළයුතුද?සන්මු නගරයේ නගරවාසීන්ගේ ආධායම් පිළිබදව නගරසභාවේ ඒ පිළිබඳ විස්තර යවිලි එක්රැස් කරන ( *Shinkoku* )දිනයේදී නගර සභාවට පැමිණ ඔබගේ ආධායම් පිළිබදව ඉදිරිපත් කරන්න.

◎ 32 පිටුවේ අමරු වචන ◎
※ආධායම පිළිබදව නගරසභාවට දැනුම් දෙන ඉල්ලුම් පත( *Shinkokusho* ) : ඔබ උපයාගත් ( එක්කාසු කරගත් ආධායම ) මුදල් ප්‍රමාණය පිළිබදව සටහන් කරනු ලබන ලියවිල්ල
※ආධායම්බදු සහතිකය ( *Shotoku・Kazei Shōmeisho* ) : ඔබට ලැබුණු ( උපයාගත් ) මුදල්සහ ඔබගේ ආධායමට අනුව ඔබගේ බදු පිළිබදව සටහන් කර ඇති ලියවිල්ල.
※බදු කාර්යාලය(Zeimusho) : රජයේ බදු පිළිබදව කළමනාකරණය කරනු ලබන රජයේ පරිපාලන ආයතනය (*ToganeZeimusho*) ( Togane Shi,Higashi Shinjyuku,1Chomei 1Ban-12 ) ඔබ නගරයට ආසන්නයේම පිහිටා ඇත.

| වැඩි විස්තර දැනගැනීම සදහා ( විමසීම් ) | ලිපිනය | දුරකථනය |
|---|---|---|
| බදු අංශය ( *Kazeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑦ | 0475-80-1281 |
| බදු එක්රැස් කිරීමේ අංශය ( *Shūzeika* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ⑧ | 0475-80-1151 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේනිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.